# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 16 දරන ප්‍රාග්ධන බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1972 දෙසැම්බර් මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 ජනවාරි මස 05 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 16 දරන
ප්‍රාග්ධන බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1972 දෙසැම්බර් මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 25/72.

1971 අංක 51 දරන ප්‍රාග්ධන බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 16 දරන ප්‍රාග්ධන බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඩු නාමය.

2. මේ පනතෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1971 අංක 51 දරන ප්‍රාග්ධන බදු පනතේ 3 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ උප වගන්තිය වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1971 අංක 51 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3) මේ පනතේ කාර්යයන් සඳහා යම් පුද්ගලයකුට 1971 මාර්තු 31 වන දින භාර්යාවක හෝ, භාර්යාවක හා දරුවන් හෝ යැපෙන ඥාතීන් එක්කෙනකු හෝ වැඩිගණනක් හෝ භාර්යාවක හා දරුවන් හා යැපෙන ඥාතීන් එක්කෙනකු හෝ වැඩිගණනක් හෝ, දරුවන් හෝ යැපෙන ඥාතීන් එක්කෙනකු හෝ වැඩිගණනක් හෝ දරුවන් හා යැපෙන ඥාතීන් එක්කෙනකු හෝ වැඩි ගණනක්, සිටිත හොත් ඔවුන්ගෙන් පවුලක් සංයුක්ත විය යුතු අතර ඒ පුද්ගලයා එම පවුලේ ප්‍රධානයා ලෙස සලකනු ලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේද ආදේශ කිරීමෙන් :—

"(අ) පීතකොමිස් භාරකරුවකු වශයෙන් හෝ ඵල භුක්ති කරුවකු වශයෙන් ඔහුට ජීවිත භුක්තියක් ඇති යම් දේපළක, ඔහු අයිතිකරු වූවාක් මෙන් ඒ දේපළ සම්බන්ධයෙන් නිශ්චය කරනු ලබන වටිනාකම;

(අඅ) පීතකොමිස් භාරකරුවකු වශයෙන්, තම මරණය හැර වෙනත් යම් නිශ්චිතව සඳහන් සිද්ධියක් සිදු වීමෙන් පසු අවසාන වන අර්ථලාභී සම්බන්ධතාව යක් තමාට ඇති යම් දේපළක, ඔහු අයිතිකරු වූවාක් මෙන් ඒ දේපළ සම්බන්ධයෙන් නිශ්චය කරනු ලබන වටිනාකම;";

(ආ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඉ) ව්‍යාපාරික ආයතනයක කොටස්කරුවකු නම් එම ව්‍යාපාරික ආයතනයෙහි ඔහුගේ සම්බන්ධතාවේ වටිනාකම;";

1—17375—12308 (72/10)

(ඈ) ඒ උපවගන්තියේ (උ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(උ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ සුරැකුම් පත්වල ඔහුගේ ආයෝජන සහ ප්‍රධාන පනතෙහි කාර්යයන් සඳහා බදු අය කළ හැකි ආදායම ගණන් බැලීමේ දී ඔහුගේ වෙනත් ආයෝජන නිසා ඔහු විශේෂ දීමනාවකට හෝ ඒ පනත යටතේ ආදයම් බද්දෙන් යම් සහනයක් ලබන්නට ඔහුට හිමිකම් ලැබුණත් නැතත් ඔහුගේ ඒ වෙනත් ආයෝජන ;";

(ඇ) ඒ උපවගන්තියේ (එ) ඡේදයෙහි අග ඇති නැවතුම වෙනුවට තිත් කොමාවක් ආදේශ කිරීමෙන් ;

(ඉ) ඒ උපවගන්තියේ අගට පහත සඳහන් අලුත් ඡේද එකතු කිරීමෙන් :—

"(ඒ) ශ්‍රී ලංකා ආණ්ඩුවට හෝ ප්‍රධාන පනතේ 16අ වන වගන්තියේ හෝ 67(1) (ආ) වන වගන්තියේ අර්ථානුකූල ව අනුමත කරන ලද පුණ්‍ය ආයතනයක් වූ යම් පුණ්‍ය ආයතනයකට යම් දේපළක් තෑගි දුන් විට හැර 1970 ඔක්තෝබර් මස 26 වන දින හෝ ඊට පසු එහෙත් 1971 අප්‍රේල් 1 වන දිනට පෙර ඔහු විසින් තෑගි දෙනු ලැබූ යම් දේපළක් ;

(ඔ) යම් පෞද්ගලික සමාගමක යම් කොටස් හෝ ණයපත්‍ර සඳහා ඒ සමාගමට හෝ තක්සේරුකරුගේ මතය අනුව ප්‍රමාණවත් නො වන යම් ප්‍රතිෂ්ඨාවක් සඳහා අන් කිසි තැනැත්තකුට 1970 ඔක්තෝබර් මස 26 වන දින හෝ ඊට පසු එහෙත් 1971 අප්‍රේල් මස 1 වන දිනට පෙර යම් අවස්ථාවක ඔහු විසින් පවරන ලද යම් දේපළක් ; හා

(ඕ) 1970 ඔක්තෝබර් මස 26 වන දින හෝ ඊට පසු එහෙත් 1971 අප්‍රේල් මස 1 වන දිනට පෙර තමා වෙත යම් දේපළක් පැවරීම සඳහා වූ ප්‍රතිෂ්ඨාව තක්සේරුකරුගේ මතය අනුව ප්‍රමාණවත් නො වන්නේ නම් ඒ ප්‍රතිෂ්ඨාව වශයෙන් ඔහු විසින් ගෙවන ලද යම් මුදලක් ;"; තව ද

(2) ඒ වගන්තියේ අගට පහත සඳහන් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(3) ව්‍යාපාරික ආයතනයක හවුල්කරුවකුට ඒ ආයතනයේ ඇති සම්බන්ධතාවේ වටිනාකම නිශ්චය කිරීමෙහි ලා ඒ ව්‍යාපාරික ආයතනයේ කීර්ති නාමය ගණන් නො ගත යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය, එහි (1) වන උප වගන්තියෙහි, පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ආ ආ) ඔහු 1971 මාර්තු මස 31 වන දින ශ්‍රී ලංකාවෙහි නේවාසික ව නො සිටි තැනැත්තකු නම් ප්‍රධාන පනතේ 6 වන වගන්තියෙහි (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ලාභ හා ආදායම් ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබූ යම් ව්‍යවසායක ඔහුගේ ආයෝජන ; ";

(2) ඒ උපවගන්තියේ (ඊ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඊ) 1971 මාර්තු 31 සිට වර්ෂ හයකට නොවැඩි කාල පරිච්ඡේදයක් සඳහා (පීතකොමිසමකට යටත් දේපළ නොවන) යම් දේපළක ඔහුට ඇති සම්බන්ධතාවය ; ";

(3) ඒ උපවගන්තියේ (ඩ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඩ) 1972 මාර්තු මස 31 වන දිනට පසු නො වී අවසාන වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ආදායම් බදු වශයෙන් හෝ ධන බදු වශයෙන් හෝ, 1971 අප්‍රේල් මස 1 වන දිනට පෙර මරණය සිදු වූ යම් තැනැත්තකුගේ බූදලය හෝ ඒ බූදලයෙන් යම් කොටසක් මේ පනතේ කාර්යය සඳහා ඔහුගේ ප්‍රාග්ධනයට ඇතුළත් කරනු ලැබුවේ නම් ඒ බූදලය හෝ ඒ බූදලයේ ඒ කොටස වෙනුවෙන් බූදල් බදු වශයෙන් ඔහුගෙන් අය විය යුතු යම් මුදලක් ; ";

(4) ඒ උපවගන්තියේ (ණ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ණ) 1971 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර ඔහු විසින් දෙන ලද යම් තෑග්ගක් වෙනුවෙන් තෑගි බදු වශයෙන් ඔහුගෙන් අය විය යුතු යම් මුදලක් ; ";

(5) ඒ උපවගන්තියේ (ත) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ත) 1971 අප්‍රේල් මස 1 වන දිනට පෙර මරණය සිදු වූ යම් තැනැත්තකුගේ බූදලයේ බූදල් බලකරුවකු වූයේ නම් ඒ බූදලය වෙනුවෙන් ගෙවිය යුතු බූදල් බද්ද ; ";

(6) ඒ උපවගන්තියේ (බ) ඡේදයෙහි, ඒ ඡේදයේ අගට යෙදෙන නැවතුම වෙනුවට තිත් කොමාව ආදේශ කිරීමෙන් ; හා

(7) ඒ උපවගන්තියේ (බ) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ම) ඔහු අයිතිකරු වන නමුත් 4 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ඒ) ඡේදයේ හෝ (ඔ) ඡේදයේ විධිවිධාන හේතුකොට ගෙන අන් යම් තැනැත්තකුගේ ප්‍රාග්ධනයෙහි ඇතුළත් කරන ලද යම් දේපළක් ;

(ය) 1970 ඔක්තෝබර් 26 වන දින හෝ ඊට පසු එහෙත් 1971 අප්‍රේල් 1 වන දිනට පෙර ඔහු විසින් පෞද්ගලික සමාගමකට පවරන ලද යම් දේපළක ප්‍රතිෂ්ඨාව වශයෙන් ඔහුට වෙන් කරන ලද කොටස් හෝ සෘණ පත්‍ර නම් ඒ පෞද්ගලික සමාගමේ ඔහුගේ කොටස් හෝ සෘණ පත්‍ර ; තව ද

(අඅ) 1970 ඔක්තෝබර් 26 වන දින හෝ ඊට පසු එහෙත් 1971 අප්‍රේල් 1 වන දිනට පෙර ඔහු විසින් කරන ලද යම් දේපළ පැවරීමක් සම්බන්ධයෙන් වූ ප්‍රතිෂ්ඨාව තක්සේරුකරුගේ මතය අනුව ප්‍රමාණවත් නො වන්නේ නම් ඒ ප්‍රතිෂ්ඨාව වශයෙන් ඔහුට ලැබෙන යම් මුදලක්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ඇතැම් නිර්වාසික සමාගම් වලට අදාළ විශේෂ විධිවිධාන.

9. නිර්වාසික සමාගමක් විසින් වෙනත් නිර්වාසික සමාගමක කොටස් හිමි නේවාසික සමාගමක කොටස් දරන අවස්ථාවක හා දෙවනු සඳහන් කරන ලද නිර්වාසික සමාගම විසින් එම සමාගමෙහි බදු අය කළ හැකි ප්‍රාග්ධනය සම්බන්ධයෙන් ප්‍රාග්ධන බදු ගෙවා ඇති බවට කොමසාරිස් සෑහීමකට පත් වන අවස්ථාවක, පළමු සඳහන් නිර්වා

සික සමාගම විසින් දෙවනු සඳහන් නිර්වාසික සමාගමෙහි අනියමින් දරනු ලබන කොටස්වල වටිනාකමට කොමසාරිස්ගේ මතය අනුව ආරෝපණය කළ හැකි ඒ පළමු සඳහන් සමාගමේ බදු අය කළ හැකි ප්‍රාග්ධනයේ කොටස වෙනුවෙන් කොමසාරිස් විසින් සාධාරණ යයි සැලකිය හැකි ප්‍රාග්ධන බදු සහනයක් ඒ පළමු සඳහන් නිර්වාසික සමාගමට කොමසාරිස් විසින් ලබා දිය හැකි ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ප්‍රාග්ධනය සංයුක්ත වන දේපළවල වටිනාකම.

10. (1) මේ වගන්තියේ අන් විධිවිධානවලට යටත් ව, යම් තැනැත්තකුගේ ප්‍රාග්ධනයේ කොටසක් වූ යම් නිශ්චල හෝ චංචල දේපළක් සම්බන්ධයෙන් මේ පනතෙහි කාර්යයන් සඳහා වටිනාකම—

(අ) 1971 මාර්තු 31 වන දින ඔහුට අයිති ව තිබුණා වූ ද 1970 මාර්තු 31 වන දින හෝ ඊට පෙර ඔහු විසින් අත්කර ගනු ලැබුවා වූ ද, යම් නිශ්චල දේපළක් හෝ යම් සමාගමක කොටස්වලින් සමන්විත වන චංචල දේපළක් සම්බන්ධයෙන් සියයට දහයක් අඩු කරනු ලැබූ ඒ දේපළෙහි වටිනාකම තක්සේරු කිරීමේ දිනයෙහි වෙළඳ අගය විය යුතු ය ;

(ආ) (අ) ඡේදයෙහි සඳහන් දේපළ නො වන අන් යම් දේපළක් සම්බන්ධයෙන් වටිනාකම තක්සේරු කිරීමේ දිනයෙහි ඒ දේපළෙහි වෙළඳ අගය විය යුතු ය.

(2) කොටස් පැවරීමේ අයිතිය සාංගමික ව්‍යවස්ථා මගින් සීමා කර ඇති හෝ තිකුත් කරන ලද කොටස්වලින් අඩකට වැඩි ප්‍රමාණයක් කෙලින් ම හෝ නම් කරනු ලැබූවන් මාර්ගයෙන් පුද්ගලයන් පස් දෙනෙක්, ඔවුන්ගේ භාර්යාවන් හෝ අඩු වයස් දරුවන් විසින් දරන්නා වූ සහ වටිනාකම තක්සේරු කිරීමේ දිනයට කලින් වූ දොළොස් මස් කාලය තුළ එක්සත් රාජධානියේ පිළිගත් ස්කන්ධ වෙළඳ මධ්‍යස්ථානයක නිල ලැයිස්තුවේ හෝ මේ උපවගන්තියෙහි කාර්යයන් සඳහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් අනුමත කරන ලද යම් බ්‍රෝකර්වරුන්ගේ සංගමයක් විසින්

නිකුත් කරන ලද එවැනි යම් ලැයිස්තුවක සඳහන් කර නොමැති බවට කොමසාරිස් සෑහීමට පත් වූ යම් සමාගමක (වරණීය කොටස් නො වන) කොටස්වලින් යම් තැනැත්තකුගේ ප්‍රාග්ධනයේ කොටසක් වූ චංචල දේපළ සමන්විත වන අවස්ථාවක ඒ කොටස්වල වටිනාකම, කොමසාරිස් එසේ විධාන කරන්නේ නම්,—

(අ) පැවත ගෙන යන ආයතනයක් වශයෙන් එම සමාගමේ (කීර්ති නාමය හැර) අන් සියලු වත්කම්වල තක්සේරු කිරීමේ දින යෙහි වෙළඳ අගය අනුව,—

(i) සමාගමේ ණය පත්‍ර, ණය ස්කන්ධ හා වරණීය කොටස් කිසිවක මුල් අගය හෝ නිදහස් කිරීමේ අගය යන මින් වැඩි කුමක් ද ඒ වැඩි අගය ;

(ii) ප්‍රතිෂ්ඨාවක් සඳහා මුදලින් හෝ මුදලේ වටිනාකමින් සද්භාවයෙන් දරන ලද හෝ ඇති කරන ලද සමාගමේ සියලු ණය ;

(iii) සාධාරණ ව හා යුක්ති සහගත ව ගණන් බැලූ විට සමාගමේ යම් අනාගත හෝ අනිශ්චිත බැරකම් කිසිවක් හෝ මුදල් ප්‍රමාණය අවිනිශ්චිත එහි යම් බැර කම් කිසිවක් වෙනුවෙන් වූ මුදල ; සහ

(iv) සේවකයන්ට විශ්‍රාම වැටුප් ගෙවීම් සඳහා හෝ ඔවුන්ගේ හෝ ඔවුන්ගේ යැපෙන්නන්ගේ හෝ ඥාතීන්ගේ අන් ආකාරයක වූ ප්‍රතිලාභය සඳහා යොදා ගැනීමට සහ අන් කිසි ම ආකාරයකින් යොදා නො ගැනීමට සද්භාවයෙන් අදහස් කරන ලද වෙනම ආයෝජනය කළ යම් සංචිත අරමුදලක මුදල

යන මේවා අඩුකොට නිශ්චය කරනු ලබන මුදලක් විය යුතුය, නැතහොත්

(ආ) ඒ කොටස් ඒ තැනැත්තා විසින් 1971 අප්‍රේල් 1 වන දිනට පෙර අත්කර ගන්නා ලද්දේ නම් (අ) ඡේදය යටතේ නිශ්චිත කරනු ලැබ සියයට දහයක් අඩු කරනු ලැබූ මුදල විය යුතු ය.

(3) ප්‍රාග්ධන බද්ද ගෙවිය යුතු යම් තැනැත්තකු විසින්, නිතිපතා ගණන් තබාගත යන ව්‍යාපාරයක් තමන් විසින් ම හෝ අන් කිසි තැනැත්තකු හෝ තැනැත්තන් සමග හවුල් ව්‍යාපාරයක් වශයෙන් පවත්වා ගන යනු ලබන අවස්ථාවක, කොමසාරිස් විසින්, ඒ ව්‍යාපාරයෙහි ඒ තැනැත්තා සතුව තිබෙන එක් එක් දේපළෙහි වටිනාකම වෙන වෙන ම නිශ්චය කරනු වෙනුවට ඒ ව්‍යාපාරයෙහි ඒ තැනැත්තා සතුව තිබෙන දේපළ සමස්තයක් වශයෙන් ගෙන ශුද්ධ වටිනාකම නිශ්චය කළ හැකි ය.

(4) යම් දේපළක් විවෘත වෙළඳ පොළෙහි වික්ණිය නොහැකි නිසා මේ වගන්තියෙහි කාර්යයන් සඳහා ඒ දේපළෙහි වෙළඳ අගය නිශ්චය කළ නො හැකි අවස්ථාවක ඒ දේපළෙහි වටිනාකම යුක්ති සහගත යයි කොමසාරිස් සලකන යම් මුදලක් විය යුතු ය.

(5) තක්සේරු කිරීමේ දිනයෙන් පසු එහෙත් 1971 අප්‍රේල් 1 වන දිනට පෙර යම් තැනැත්තකුගේ නිශ්චල දේපළක වටිනාකම—

(අ) එම දේපළ සම්බන්ධයෙන් කරන ලද යම් වැඩි දියුණු කිරීම්, එකතු කිරීම් හෝ වෙනස් කිරීම් හේතුකොට ගෙන වැඩි වී ඇති අවස්ථාවක එම වැඩි කිරීම්, එකතු කිරීම් හෝ වෙනස් කිරීම් පිළිබඳ වියදම තක්සේරු කිරීමේ දිනයෙහි එම දේපළේ වටිනාකමට එකතු කළ යුතු ය. නැත හොත්,

(ආ) එම දේපළට කරන ලද යම් හානියක් හෝ එම දේපළ මත වූ යම් ගොඩනැගිල්ලක් විනාශ කිරීම හෝ බිඳ හෙලීම හේතුකොට ගෙන අඩු වී ඇති අවස්ථාවක, කොමසාරිස්ගේ මතය අනු ව එම හානියේ, විනාශයේ හෝ බිඳ හෙලීමේ ප්‍රතිඵලයක් වශයෙන් වූ එම දේපළෙහි අගය අඩුවීමට සමාන වන යම් මුදල් ප්‍රමාණයක් වටිනාකම තක්සේරු කිරීමේ දිනයෙහි ඒ දේපළෙහි වටිනාකමින් අඩු කළ හැකි ය.

මේ උපවගන්තියේ කාර්යයන් සඳහා යම් නිශ්චල දේපළක වටිනාකම අඩු වී ඇති බව ඔප්පු කිරීමේ භාරය එහි වටිනාකම අඩු වී ඇතැ යි කියන තැනැත්තා මත පැවරිය යුතු ය.

(6) යම් තැනැත්තකුගේ ප්‍රාග්ධනයෙහි කොටසක් වන යම් දේපළක්,—

(අ) 1970 මාර්තු 31 වන දිනට පසු එහෙත් 1971 අප්‍රේල් 1 වන දිනට පෙර ඒකාබද්ධ කරන ලද හෝ එකට එක් කරන ලද යම්

සමාගම් දෙකක හෝ වැඩි ගණනක තම කොටස් වෙනුවෙන් තමාට ලැබුණු කොටස්වලින් සමන්විත වන අවස්ථාවක; හෝ

(ආ) 1970 මාර්තු 31 වන දිනට පසු එහෙත් 1971 අප්‍රේල් 1 වන දිනට පෙර ප්‍රාග්ධන ආපසු ගෙවීමක් හෝ බෙදා දීමක් කරනු ලැබ ඇත්තේ යම් කොටස් සම්බන්ධයෙන් ද එබඳු කොටස්වලින් සමන්විත වන අවස්ථාවක ; හෝ

(ඇ) 1970 ඔක්තෝබර් 26 වන දින හෝ ඊට පසු එහෙත් 1971 අප්‍රේල් 1 වන දිනට පෙර සමාගමට පවරන ලද යම් දේපළක් වෙනුවෙන් යම් තැනැත්තකුට යම් කොටස් හෝ සෘණ පත්‍ර වෙන් කරන ලද පෞද්ගලික සමාගමක කොටස්වලින් හෝ සෘණ පත්‍රවලින් සමන්විත වන අවස්ථාවක

(1) වන උපවගන්තියෙහි කුමක් සඳහන් වුව ද එය නො තකා එම දේපළේ වටිනාකම කොමසාරිස් විසින් නිශ්චය කරනු ලබන මුදලක් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 11 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

'වටිනාකම තක්සේරු කිරීමේ දිනය.

11. මේ පනතේ කාර්යයන් සඳහා වටිනාකම තක්සේරු කිරීමේ දිනය—

(අ) 1971 මාර්තු 31 වන දින යම් තැනැත්තකුගේ ප්‍රාග්ධනයෙහි කොටසක් වන යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් වූ විට,—

(i) ඔහු විසින් ඒ දේපළ 1970 මාර්තු 31 වන දින හෝ ඊට පෙර අත්කර ගනු ලැබුවේ නම් 1970 මාර්තු 31 වන දිනය විය යුතු ය ; තව ද

(ii) ඒ දේපළ ඔහු විසින් 1970 මාර්තු 31 වන දිනට පසු එහෙත් 1971 අප්‍රේල් 1 වන දිනට පෙර අත්කර ගනු ලැබුවේ නම් එය අත්කර ගනු ලැබූ දිනය විය යුතු ය ; එමෙන් ම

(ආ) 1971 මාර්තු 31 වන දින යම් තැනැත්තකුගේ ප්‍රාග්ධනයෙහි කොටසක් වන යම් චංචල දේපළක් සම්බන්ධයෙන් වූ විට,—

(i) එම දේපළ කොටස්වලින් සමන්විත වන අවස්ථාවක එම දේපළ 1970 මාර්තු 31 වන දින හෝ ඊට පෙර අත්කර ගනු ලැබුවේ නම් 1970 මාර්තු 31 වන දිනය හෝ එම දේපළ 1970 අප්‍රේල් 1 වන

දින හෝ එදිනට පසු අත්කර ගනු ලැබුවේ නම් එම අත්කර ගනු ලැබූ දිනය විය යුතු ය; තව ද

(ii) එම දේපළ කොටස්වලින් සමන්විත නො වන අවස්ථාවක 1971 මාර්තු 31 වන දිනය විය යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියෙහි (2) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද දැන්වීමක ප්‍රතිඵල වශයෙන් ස්වාමි පුරුෂයාගේ ශුද්ධ ප්‍රාග්ධනය සම්බන්ධයෙන් ද භාර්යාවගේ ශුද්ධ ප්‍රාග්ධනය සම්බන්ධයෙන් ද ප්‍රාග්ධන බද්ද වෙන වෙන ම තක්සේරු කරනු ලැබූ අවස්ථාවක, ස්වාමි පුරුෂයාගේ ශුද්ධ ප්‍රාග්ධනයෙහි වටිනාකම හා භාර්යාවගේ ශුද්ධ ප්‍රාග්ධනයෙහි වටිනාකම ද ස්වාමි පුරුෂයා හා භාර්යාව විසින් සපයන ලද ප්‍රාග්ධන වාර්තා අනු ව ඒ ස්වාමිපුරුෂයා හා භාර්යාව යන දෙදෙනාගේ ම හෝ දරුවකු හෝ යැපෙන ඥාතියකු වූ යම් පුද්ගලයකුගේ ශුද්ධ ප්‍රාග්ධනයෙහි වටිනාකම එකට එකතු කොට තමා ඒ දැන්වීම නො කරන ලද නම් ස්වාමිපුරුෂයා විසින් ගෙවිය යුතු වීමට තිබුණු ප්‍රාග්ධන බද්ද මේ පනතේ විධිවිධාන වලට අනුකූල ව නිශ්චය කළ යුතු ය. එසේ නිශ්චය කරන ලද ප්‍රාග්ධන බද්දෙහි මුදල, ස්වාමිපුරුෂයා හා භාර්යාව යන දෙදෙනාගේ වෙන් වෙන් ශුද්ධ ප්‍රාග්ධනයෙහි වටිනාකම ඒ දෙදෙනාගේ එකතු කළ ශුද්ධ ප්‍රාග්ධනයෙහි වටිනාකමට දරන අනුපාතය අනුව ස්වාමිපුරුෂයා හා භාර්යාව අතර බෙදා වෙන් කළ යුතු ය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 23 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

'තක්සේරු පිළිබඳ දැන්වීම.

23. ප්‍රධාන පනතේ 95 වන වගන්තියේ විධිවිධාන, ඒ විධිවිධාන මේ පනතේ විධිවිධාන වූවාක් මෙන් සහ ඒ විධිවිධානවල ප්‍රධාන පනත සම්බන්ධයෙන් නො ව මේ පනත සම්බන්ධයෙන් සඳහන් කර තිබෙන්නාක් මෙන් සහ,—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙන් "තක්සේරු කරනු ලැබූ ආදායමේ, ධනයේ හෝ තෑගිවල ප්‍රමාණය ද අය කරනු ලැබූ අය බදු ප්‍රමාණය ද" යන වචන වෙනුවට "තක්සේරු කරනු ලැබූ ශුද්ධ ප්‍රාග්ධනයේ ප්‍රමාණය ද අය කරනු ලැබූ ප්‍රාග්ධන බදු ප්‍රමාණය ද" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන්; හා

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "අය බදු අනුපාතිකය සංශෝධනය කිරීමේ හේතුවෙන්, යම් තක්සේරු

කිරීමේ දැන්වීමක අය කරනු ලැබූ අය බදු ප්‍රමාණය වෙනස් කිරීම අවශ්‍ය වුව හොත් " යන වචන වෙනුවට " ප්‍රාග්ධන බදු අනුපාතිකය සංශෝධනය කිරීමේ හේතුවෙන් යම් තක්සේරු කිරීමේ දැන්වීමක අය කරනු ලැබූ ප්‍රාග්ධන බදු ප්‍රමාණය වෙනස් කිරීම අවශ්‍ය වුව හොත් " යන වචන ආදේශ කරනු ලැබූ වාක් මෙන්

අදාළ විය යුතු ය. '.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 24 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

' තක්සේරු කිරීම යනාදියේ වලංගු භාවය.

24. ප්‍රධාන පනතේ 96 වන වගන්තියේ විධිවිධාන ඒ විධිවිධාන මේ පනතේ විධිවිධාන වූවාක් මෙන් සහ ඒ විධිවිධානවල ප්‍රධාන පනත සම්බන්ධයෙන් නොව මේ පනත සම්බන්ධයෙන් සඳහන් කර තිබෙන්නාක් මෙන් සහ ඒ වගන්තියෙහි (2) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි " තක්සේරු කරනු ලැබූ ආදායමේ, ධනයේ හෝ තෑගිවල ප්‍රමාණය පිළිබඳ ව හෝ අය කරනු ලැබූ අය බදුවල ප්‍රමාණය පිළිබඳ ව " යන වචන වෙනුවට " තක්සේරු කරනු ලැබූ ශුද්ධ ප්‍රාග්ධන ප්‍රමාණය හෝ අයකරනු ලැබූ ප්‍රාග්ධන බදු ප්‍රමාණය පිළිබඳ ව " යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන් අදාළ විය යුතු ය. '.

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" තක්සේරුවක් කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා විසින් නිශ්චල දේපළ බැහැර කිරීම පිළිබඳ තහනම.

25. යම් තැනැත්තකු සම්බන්ධයෙන් මේ පනත යටතේ ප්‍රාග්ධන බදු තක්සේරුවක් කරනු ලැබ ඒ තැනැත්තා විසින් ඒ බද්ද ගෙවා නැති අවස්ථාවක, ඒ තැනැත්තා විසින් හෝ ඔහු ගේ පවුලේ යම් සාමාජිකයකු විසින්, කොමසාරිස් ගේ ලිඛිත අවසරයක් ඇතිව මිස අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තාට හෝ ඔහුගේ පවුලේ යම් සාමාජිකයකුට අයත් යම් නිශ්චල දේපළක් හෝ යම් නිශ්චල දේපළක යම් අයිතිවාසිකමක් අන් කිසි තැනැත්තකු වෙත සතු නො කළ යුතු ය :

එසේ වුව ද ඒ තැනැත්තා හෝ ඔහුගේ පවුලේ යම් සාමාජිකයකු විසින් කොමසාරිස් වෙත දැන්වීමක් කිරීමෙන් පසු අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තාට හෝ ඔහුගේ පවුලේ යම් සාමාජිකයකුට අයත් යම් නිශ්චල දේපළක් හෝ යම් නිශ්චල දේපළක යම් අයිතිවාසිකමක් ජනරජය වෙත සතු කළ හැකි ය. ".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තිය 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ; හා

(2) ඒ වගන්තිය අගට පහත සඳහන් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) 26 වන වගන්තිය යටතේ දෙන ලද විරෝධතා දැක්වීමේ දැන්වීමක් පිළිබඳ පරීක්ෂණය ආරම්භ වීමට පෙර යම් අවස්ථාවක කොමසාරිස් විසින්, විරෝධය දක්වන්නා විසින් (1) වන උපවගන්තිය යටතේ සපයන ලද ලැයිස්තුවට යම් එකතු කිරීමක් කිරීමට යම් යුක්ති සහගත හේතුවක් පිට ඔහුට අවසර දිය හැකි ය.".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) මේ පනත යටතේ කරන ලද තක්සේරුවකට විරුද්ධව වලංගු විරෝධතා දැක්වීමේ දැන්වීමක් හෝ අභියාචනයක් ඉදිරිපත් කරනු නො ලැබූ අවස්ථාවක හෝ මෙම පනත යටතේ කරන ලද තක්සේරුවට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබූ විරෝධතා දැක්වීමේ දැන්වීමක් 29 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක හෝ විරෝධතා දැක්වීමක් හෝ අභියාචනයක් අනුව මේ පනත යටතේ තක්සේරුවක් සම්බන්ධයෙන් නිශ්චය කරනු ලැබූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි මේ පනත යටතේ කරන ලද තක්සේරුව හෝ විරෝධතා දැක්වීම හෝ අභියාචනය අනුව නිශ්චය කරන ලද තක්සේරුව මේ පනතේ සියලු කාර්යයන් සඳහා අවසානාත්මක හා තිරණාත්මක විය යුතු ය.".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) ප්‍රාග්ධන බද්ද ගෙවිය යුතු යම් තැනැත්තකු තක්සේරු දැන්වීමේ හෝ 38 වන වගන්තිය, 39 වන වගන්තිය හෝ 42 වන වගන්තිය යටතේ ඔහුට භාර දෙනු ලැබූ යම් දැන්වීමක සඳහන් කර ඇති ආකාරයට ඒ බද්ද ගෙවීමට අසමත් වූවහොත්, 37 වන වගන්තිය යටතේ දීමට විනිශ්චයකාර මණ්ඩලය වෙත බලය පැවරී ඇති යම් සහන සඳහා ඔහු විසින් ඒ විනිශ්චයකාර මණ්ඩලය වෙත පෙත්සමක් ඉදිරිපත් කළ හැකි ය. සහන සඳහා වූ සෑම පෙත්සමක්ම ලියවිල්ලකින් විය යුතු අතර අවස්ථාවෝචිත පරිදි, තක්සේරු දැන්වීම හෝ අන් දැන්වීම නිකුත් කරනු ලැබූ දිනෙන් පසුව දින තිහක් ඇතුළත මූල මණ්ඩලයේ සභාපති වෙත යැවිය යුතු ය.".

(2) ඒ වගන්තිය අගට පහත සඳහන් අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(4) මණ්ඩලය වෙත (3) වන උපවගන්තිය යටතේ යොමු කරන ලද යම් පෙත්සමක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කරනු ලබන නියමයක් අවසානාත්මක

හා තීරණාත්මක විය යුතු අතර කිසිම අධිකරණයක දී අභියාචනයක්, රිට් ආඥාවක්, මැන්ඩේට් බලපත්‍රයක් මාර්ගයෙන් හෝ අන් ලෙසකින් එය ප්‍රශ්න නො කළ යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" මණ්ඩලය විසින් දෙනු ලබන සහන.

37. (1) 36 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද පෙත්සමක් මත මණ්ඩලය විසින් ඔහුට දිය හැකි සහන පහත දක්වන දේ අතුරෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් විය යුතු ය :—

(අ) ප්‍රාග්ධන බද්ද හෝ ඒ බද්දේ යම් වාරිකයක් ගෙවීම සඳහා වූ කාලපරිච්ඡේදය දීර්ඝ කිරීමක්,

(ආ) ප්‍රාග්ධන බද්ද වාරික මගින් ගෙවීමට අවසර දීම,

(ඇ) ප්‍රාග්ධන බද්ද ගෙවීම සඳහා ඔහුට අවසර දී ඇති වාරික සංඛ්‍යාව වැඩි කිරීමක්,

(ඈ) ඒ තැනැත්තා සතු යම් නිශ්චල දේපළක් ජනරජයට දීමට අවසර දීම.

(2) යම් තැනැත්තකුගේ යම් නිශ්චල දේපළක් ජනරජයට දීමට මණ්ඩලය විසින් ඒ තැනැත්තාට අවසර දී ඇති විටක, ඒ තැනැත්තා ඉදිරිපත් කළ හැකි නිශ්චල දේපළ මණ්ඩලය විසින් නිශ්චය කළ යුතු ය :

එසේ වුව ද කරුණු කියා සිටීමට අවස්ථාවක් උකස්ලාභියාට දීමෙන් පසු හා උකස සම්බන්ධයෙන් අය විය යුතු මුදල ගෙවීමට ද උකස්කරු විසින් ගෙවිය යුතු ප්‍රාග්ධනය අය කර ගැනීමට ද ඒ දේපළෙහි වටිනාකම ප්‍රමාණවත් යැ යි මණ්ඩලය සෑහීමකට පත් වුවහොත් මිස උකසකට යටත් දේපළක් මණ්ඩලය විසින් එසේ නිශ්චය නො කළ යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (1) යම් තැනැත්තකු විසින් 36 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් පෙත්සමක් පිළිබඳ ව මණ්ඩලය විසින් කරන ලද නියමයක් මගින්, ඒ තැනැත්තාට අයත් සහ නිශ්චිත නිශ්චල දේපළක් ජනරජය

වෙත භාර දීමට ඔහුට අවසර දී ඇති අවස්ථාවක ඒ නියමය ඔහුට දැනුම් දෙන ලියවිල්ලෙහි දිනයෙන් පසු දින පහළොවක් ඇතුළත දී ඔහු විසින්,—

(අ) ඒ දේපළ සම්බන්ධ සම්පූර්ණ විස්තර;

(ආ) ඒ දේපළට ඇති තම අයිතිය

සඳහන් කරමින් ලිඛිත දැන්වීමක් කොමසාරිස් වෙත භාර දිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (6) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(6) යම් තැනැත්තකුගේ නිශ්චල දේපළක් (3) වන උපවගන්තිය යටතේ ජනරජය වෙත පවරනු ලැබූ සහ ඒ තැනැත්තා සම්බන්ධයෙන් ප්‍රාග්ධන බද්ද තක්සේරු කිරීමේ දී ඒ දේපළට දී ඇති වටිනාකම ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු ප්‍රාග්ධන බදු මුදල් ප්‍රමාණයට නො අඩු වන අවස්ථාවක ඒ තැනැත්තා විසින් ප්‍රාග්ධන බද්ද ගෙවන ලද ලෙස සැලකිය යුතු අතර, ඔහු සම්බන්ධයෙන් කරන ලද ප්‍රාග්ධන බදු තක්සේරුවෙහි එම දේපළට නියම කරන ලද වටිනාකම 1972 මාර්තු 31 වන දින එම දේපළෙහි වෙළඳ අගයට වැඩිවීම හෝ අඩු වීම අනුව,—

(අ) 1972 මාර්තු 31 වන දින එම දේපළෙහි වෙළඳ වටිනාකම හා ඒ තක්සේරුවෙහි ඒ දේපළ සම්බන්ධයෙන් නියම කර ඇති වටිනාකම හා අතර ඇති අනුපාතය ඔහු සම්බන්ධයෙන් කරන ලද ප්‍රාග්ධන තක්සේරුවෙහි ඒ දේපළ සම්බන්ධයෙන් නියම කර ඇති වටිනාකම හා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු ප්‍රාග්ධන බද්ද හා අතර ඇති වෙනස සමග දරන්නේ යම් මුදලක් ද ඒ මුදලට, හෝ

(ආ) එම දේපළ සම්බන්ධයෙන් නියම කරන ලද වටිනාකම හා ඔහු විසින් ගෙවිය යුතු ප්‍රාග්ධන බද්ද අතර වෙනසට සමාන මුදලට

ඔහු හිමිකම් ලැබිය යුතු ය.

ඒ තැනැත්තා සම්බන්ධයෙන් කරන ලද ප්‍රාග්ධන බදු තක්සේරුවෙහි එම දේපළට නියම කරන ලද වටිනාකම ගෙවිය යුතු මුදලට අඩු වන අවස්ථාවක ප්‍රාග්ධන බද්දේ ඉතුරු කොටස කොමසාරිස් විසින් ඒ තැනැත්තාට දෙනු ලබන ලිඛිත දැන්වීමක නිශ්චිතව සඳහන් කළ යුතු දිනක හෝ ඊට පෙර සම්පූර්ණ මුදල වශයෙන් හෝ එසේ නිශ්චිතව සඳහන් කළ යුතු යම් වාර කොටස් ගණනකින් ගෙවිය යුතු ය. එසේ නොගෙවන ලද යම් මුදලක් නො ගෙවා පැහැර හරින ලද්දක් ලෙස සැලකෙන අතර එම තැනැත්තා මෙම පනතේ කාර්යයන් සඳහා ගෙවීම පැහැර හරින්නකු ලෙස සැලකිය යුතු ය.".

(3) (6) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

" (7) (6) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු ලැබීමට හිමිකම් ඇති මුදල ගෙවීමට පෙර එම තැනැත්තා ගෙන් ආණ්ඩුවට අය විය යුතු යම් මුදලක් හෝ මුදල් එකී මුදලෙන් අඩු කළ හැකි ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 42 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 42 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" ප්‍රාග්ධන බද්ද හෝ ප්‍රාග්ධන බද්දේ වාරිකයක් ගෙවීම ප්‍රමාද කිරීම සඳහා දණ්ඩනය.

42. (1) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු සම්පූර්ණ ප්‍රාග්ධන බද්ද හෝ එහි කොටසක් නො ගෙවා පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ගෙවීම් පැහැර හරින ලද මුදල් ප්‍රමාණයෙන් සියයට පහ කට සමාන මුදලක් ඒ මුදල් ප්‍රමාණයට එකතු කළ යුතු අතර, ඒ මුදල් ප්‍රමාණය එසේ එකතු කරන ලද මුදල ද සමග දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් දින හෝ ඊට පෙර ගෙවන ලෙස ඒ තැනැත්තාට නියම කරමින් ලිඛිත දැන්වීමක් කොමසාරිස් විසින් ඔහුට දිය යුතු ය. ගෙවීම එසේ කරනු නො ලැබූ අවස්ථාවක, ඒ මුදල ගෙවන තුරු, එසේ ගෙවීම පැහැර හැර ඇති මුදල් ප්‍රමාණයෙන් සියයට පහළොවකට වැඩි නො වන මුදල් ප්‍රමාණයක් හෝ මුදල් ප්‍රමාණ කොමසාරිස් විසින් එකී මුදල් ප්‍රමාණයට තවදුරටත් එකතු කළ හැකි ය.

(2) අභියාචනයක අවසානාත්මක නිශ්චය කිරීමෙන් පසු ව (1) වන උපවගන්තිය යටතේ යම් මුදල් ප්‍රමාණයක් හෝ මුදල් ප්‍රමාණ එකතු කරනු ලැබුවා වූ ද ගෙවීම් පැහැර හරින ලද්දා වූ ද ප්‍රාග්ධන බදු මුදල අඩු කරනු ලැබූ අවස්ථාවක, ඒ මුදල් ප්‍රමාණය හෝ ප්‍රමාණ එසේ අඩු කරනු ලැබූ මුදල අනු ව ගණන් බලනු ලැබිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 51 වන වගන්තිය අගට පහත සඳහන් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

' (3) 1970 ඔක්තෝබර් 26 වන දින හෝ ඊට පසු යම් දේපලක් තෑගි දෙනු ලැබූ හා ඒ දේපලට ආරෝපණය කළ යුතු ලෙස කොමසාරිස්ට පෙනෙන ප්‍රාග්ධන බද්ද ත්‍යාගි දායකගෙන් එකතු කර ගැනීම හෝ අය කර ගැනීම කළ නො හැකි අවස්ථාවක, ත්‍යාගිලාභී සම්බන්ධයෙන් කිසිම තක්සේරුවක් නො කරනු ලැබුව ද ඒ දේපලට ආරෝපණය කරන ලබන ප්‍රාග්ධන බද්දේ ඒ කොටස ත්‍යාගිලාභියගෙන් එකතු කර ගැනීම හෝ අය කර ගැනීම කළ හැකි අතර, ඒ අනුව ප්‍රාග්ධන බද්ද එකතු කිරීමට හා අය කිරීමට අදාළ මේ පනතේ විධිවිධාන ඒ ත්‍යාගිලාභියාට අදාළ විය යුතු ය.

මෙම උපවගන්තියෙහි " ත්‍යාගිදායක " හා " ත්‍යාගිලාභී " යන යෙදුම්වලට ප්‍රධාන පනතේ 129 වන වගන්තියෙහි ඒ යෙදුම්වලට දෙන ලද අර්ථය ම තිබිය යුතු ය. '.

19. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 51 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එහි 51අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්ති යෙහි 51අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

" තමාට ජීවිත භුක්තිය ඇති දේපළක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු ප්‍රාග්ධන බද්ද අයකර ගැනීමට අදාළ විශේෂ විධිවිධාන.

51අ. (1) (අ) යම් තැනැත්තකු ගෙවිය යුතු ප්‍රාග්ධන බද්ද හෝ ප්‍රාග්ධන බදු කොටසක් ඔහුට ජීවිත භුක්තියක් ඇති යම් දේපළක් වෙනුවෙන් වූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින්, ඒ තැනැත්තා වෙත දෙනු ලැබූ තක්සේරු දැන්වීමේ දිනයෙන් පසු එක් මාසයක් ඇතුළත කොමසාරිස් වෙත දෙනු ලබන ලිඛිත දැන්වීමක් මඟින්, ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු ඒ දේපළවලට ආරෝපණය කරනු ලබන ඒ ප්‍රාග්ධන බදු ප්‍රමාණය හෝ ඒ ප්‍රාග්ධන බදු කොටස ඒ දේපළ සම්බන්ධයෙන් අයකිරීමක් වශයෙන් සලකන ලෙස කොමසාරිස්ගෙන් ඉල්ලා සිටිය හැකි අතර ඊට පසු එම දේපළ ඒ මුදල ගෙවීම සඳහා විශේෂයෙන් බැඳී තිබිය යුතුවාක් මෙන් ම යටත් විය යුතු ය. තවද එසේ බැඳී ඇති බව හා යටත් බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

(ආ) (අ) ඡේදයේ සඳහන් යම් දේපළකට ආරෝපණය කරනු ලබන ප්‍රාග්ධන බද්ද නොගෙවා පැහැරහරිනු ලැබූ අවස්ථාවක, ඒ බද්ද අයවිය යුත්තේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා විසින් ඒ ඡේදය යටතේ දැන්වීමක් දෙනු ලැබූ ලෙස සැලකිය යුතුය.

(ඇ) මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ දෙනු ලබන දැන්වීමක් ඉඩම්වලින් සමන්විත වන යම් දේපළවලට ආරෝපණය කළ හැකි ප්‍රාග්ධන බද්ද සම්බන්ධයෙන් වූ අවස්ථාවක, ඒ ඉඩමට බලපාන නිත්‍යානුකූල ලේඛනයක් ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන විට ඒ ඉඩම වෙනුවෙන් දැක්විය යුතු ලෙස ඒ ආඥාපනතේ 13 වන වගන්තියේ නියමිත ඒ ඉඩමට අදාළ යම් සියලු විස්තර ඒ දැන්වීමෙහි දැක්විය යුතු ය.

(2) ඉඩම්වලින් සමන්විත යම් දේපළවලට ආරෝපණය කළ හැකි ප්‍රාග්ධන බදු ප්‍රමාණය සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබූ හෝ දෙනු ලැබ ඇතැයි සැලකෙන අවස්ථාවක කොමසාරිස් විසින්,—

(අ) එම දේපළවලට අදාළ අවශ්‍ය විස්තර දැක්වෙන හා එම දේපළවලට ආරෝපණය කළ හැකි ප්‍රාග්ධන බදු මුදල ගෙවීම සඳහා එම දේපළ බැඳී ඇති බව හා යටත් බව ප්‍රකාශ කෙරෙන දැන්වි

මක් ලියාපදිංචි කිරීම සඳහා උචිත ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත භාර දීමට හෝ යැවීමට සැලැස්විය යුතු ය.

(ආ) මෙම පනතේ 75 වන වගන්තියෙහි සඳහන් ආකාරයට මෙම පනතේ විධි විධාන වූවාක් මෙන් අදාළ කර ගන්නා ලද ප්‍රධාන පනතේ 124 වන වගන්තියෙහි විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද එය නොතකා, එම දේපළවලට ආරෝපණය කළ හැකි ප්‍රාග්ධන බද්ද එම දේපළ කෙරෙහි සම්බන්ධතාවක් දක්වන යම් කෙනකු විසින් දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් කාල පරිච්ඡේදය ඇතුළත ගෙවනු ලැබුව හොත් මිස, එම දේපළ හෝ එහි යම් කොටසක් ජනරජය වෙත සතු කිරීමට යටත් බව ප්‍රකාශ කෙරෙන දැන්වීමක්, ප්‍රමාණවත් ප්‍රසිද්ධියක් දිය හැකි යැ යි තමාට පෙනෙන යම් ආකාරයකින් ප්‍රසිද්ධ කිරීමට සැලැස්විය යුතු ය. තව ද

(ඇ) (ආ) ඡේදය යටතේ පළ කරන ලද දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් කාලය ඇතුළත දී ඒ දේපළවලට ආරෝපණය කළ හැකි ප්‍රාග්ධන බද්ද ගෙවා නැති අවස්ථාවක,—

(i) එම ප්‍රාග්ධන බද්දේ ප්‍රමාණය, හා

(ii) (1) වන උපවගන්තිය යටතේ දැන්වීම දෙනු ලැබුවේ හෝ දෙනු ලැබ ඇතැයි සැලකෙන්නේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත් තාගේ නම හා ලිපිනය සහ ඵල භුක්තිකරුවකු වශයෙන් ඒ තැනැත්තාට එම දේපළ සම්බන්ධයෙන් ජීවිත භුක්තියක් පමණක් ඇති අවස්ථාවක එම දේපළවල අයිතිකරුගේ නම හා ලිපිනය සොයා ගත හැකි නම් ඒ නම හා ලිපිනය

නිශ්චිතව සඳහන් කරමින් ප්‍රකාශයක් මුදල් විෂය භාර අමාත්‍යවරයා වෙත යැවිය යුතු ය.

(3) (2) වන උපවගන්තියෙහි (අ) ඡේදය යටතේ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත භාර දෙන ලද හෝ යවන ලද දැන්වීමක් ඉඩම්වලට බලපාන නිත්‍යානුකූල ලේඛනයක් ලියාපදිංචි කිරීම සඳහා

ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත මගින් විධි විධාන සලස්වා ඇති ආකාරයට ඔහු විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර, එය දැන්වීම අදාළ වන ඉඩමට බලපාන නිත්‍යානුකූල ලේඛනයක් ලෙස ඒ කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ දැන්වීමක් ලියාපදිංචි කරනු ලැබුවේ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද ඒ ඉඩමට ආරෝපණය කළ හැකි ප්‍රාග්ධන බද්ද ගෙවනු ලැබූ අවස්ථාවක කොමසාරිස් විසින්, ඒ දැන්වීම පිළිබඳ ලියාපදිංචිය අවලංගු කරන ලෙස ඉඩම් රෙජිස්ට්‍රාර්ගෙන් ලියවිල්ලකින් ඉල්ලා සිටිය යුතු අතර ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් එවිට ඒ ලියාපදිංචිය අවලංගු කළ යුතු ය.

(5) (2) වන උපවගන්තියෙහි (ඇ) ඡේදයෙහි සඳහන් ප්‍රකාශය ලැබීමෙන් පසු මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවක් මගින්, ඒ ප්‍රකාශයෙහි නිශ්චිත ව සඳහන් දේපළ හෝ එම දේපළවලට ආරෝපණය කළ හැකි ප්‍රාග්ධන බද්ද අය කර ගැනීම සඳහා කොමසාරිස් විසින් ප්‍රමාණවත් යැයි සැලකිය හැකි එම දේපළවල යම් කොටසක් ජනරජය වෙත සතු කළ හැකි ය.

ඒ ආඥාව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු ඒ ආඥාවෙහි නිශ්චිත ව සඳහන් දේපළ හෝ එහි කොටස සියලු බැඳීම්වලින් තොර ව ජනරජය වෙත සතු කිරීමේ බලපෑම ඒ ආඥාවෙහි තිබිය යුතුය.

(6) (5) වන උපවගන්තිය යටතේ ආඥාවක් මගින් ජනරජය වෙත සතු කරන ලද දේපළ හෝ එම දේපළවල කොටසේ වටිනාකම එම දේපළට ආරෝපණය කළ හැකි ප්‍රාග්ධන බදු ප්‍රමාණයට වැඩි වූ අවස්ථාවක 39 වන වගන්තියේ (6) වන උපවගන්තියෙහි දැක්වෙන ආකාරයට ගණන් බලනු ලැබූ මුදලක් එම දේපළ පිහිටි ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය විසින් එම මුදල පිළිබඳ සුදුස්සක් කිරීමේ ආඥාවක් කරන තුරු එම අධිකරණයට ගෙවිය යුතු ය. එම දේපළ හෝ එහි කොටසක් ජනරජය වෙත සතු කරනු ලැබූ අවස්ථාවෙහි එම දේපළ යටත් වූ නිරවුල් කර දීමට එම මුදල යටත් විය යුතුය.

(7) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් මුදල් වලින් සමන්විත වන යම් දේපලක් සම්බන්ධයෙන් වූ අවස්ථාවක කොමසාරිස් විසින්, එම දේපලට ආරෝපණය කළ හැකි ප්‍රාග්ධන බදු ප්‍රමාණය සඳහන් කරමින් එම දේපළ කෙරෙහි පාලන බලය ඇති දිසා අධිකරණය වෙත සහතිකයක් නිකුත් කළ හැකි අතර අධිකරණය විසින් එවිට එම දේපලෙන් එම මුදල ගෙවීමට විධාන කළ යුතුය.

(8) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් දේපලකට ආරෝපණය කළ හැකි ප්‍රාග්ධන බදු මුදල ගෙවීම පැහැර හැරීම හේතු කොට ගෙන 42 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ එම මුදලට යම් මුදලක් හෝ මුදල් එකතු කර ඇති අවස්ථාවක එසේ එකතු කරන ලද සම්පූර්ණ මුදල හෝ මුදල් හෝ ඉන් කොටසක් කොමසාරිස් විසින් තම අභිමතය පරිදි අඩු කළ හැකිය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ අගට පහත සඳහන් අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(6) මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් මූල මණ්ඩලයේ ලේකම්වරයකු හා එක් සහකාර ලේකම්වරයකු හෝ ඊට වැඩි ගණනක් පත් කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(3) මූල මණ්ඩලයේ සභාපති විසින්, විනිශ්චයකාර මණ්ඩලයක ලේකම් වශයෙන් මූල මණ්ඩලයේ සහකාර ලේකම්වරයකු පත් කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 57වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"විනිශ්චයකාර මූල මණ්ඩලයේ සභාපති ආදීන්ගේ පාරිශ්‍රමිකය.

**57.** මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කළ හැකි යම් පාරිශ්‍රමිකයක් විනිශ්චයකාර මූල මණ්ඩලයේ සභාපතිට ද විනිශ්චයකාර මූල මණ්ඩලයේ සාමාජිකයන්ට ද විනිශ්චයකාර මූල මණ්ඩලයේ ලේකම්ට ද විනිශ්චයකාර මූල මණ්ඩලයේ සහකාර ලේකම්වරුන්ට ද ගෙවිය හැකි ය.".

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය මෙයින් ඉවත් කොට එය වෙනුවට පහත සඳහන්, අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය ප්‍රතියෝජනය **කිරීම.**

" මියගිය තැනැත්තකු සම්බන්ධයෙන් මුදල් බලකරු විසින් ප්‍රාග්ධන බද්ද ගෙවිය යුතු බව.

72. මිය ගිය තැනැත්තකු ජීවත්ව සිටියේ නම් ඔහු විසින් ගෙවිය යුතුව තිබුනු ප්‍රාග්ධන බද්ද ඒ මිය ගිය තැනැත්තාගේ මුදලයේ මුදල් බලකරුවකු විසින් ගෙවිය යුතු අතර ඒ තැනැත්තා ජීවත් ව සිටියේ නම් මෙම පනත යටතේ ඔහු විසින් කළයුතු ව තිබූ සියලුම ක්‍රියා, කරුණු සහ දේවල් කිරීමට ඒ මුදල් බලකරු යටත් විය යුතුය :

එසේ වුවද—

(අ) මියගිය තැනැත්තාගේ යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් සම්බන්ධයෙන් මුදල් බලකරුට විරුද්ධව නඩු පැවරුමක් නොකළ යුතු ය. තවද

(ආ) මෙම වගන්තිය යටතේ මුදල් බලකරුවකුගේ වගකීම —

(i) මෙම වගන්තිය යටතේ ප්‍රාග්ධන බද්ද ගෙවීමේ වගකීම පැන නැගුන බවට මුදල් බලකරු වෙතට නිවේදනය භාර දෙන දිනයේ ඔහු සන්තක ව හෝ ඔහුගේ පාලනයෙහි තිබෙන මිය ගිය තැනැත්තාගේ මුදලයට හා

(ii) අර්ථ ලාභියකුට ලැබී තිබිය හැකි ඒ මුදලයෙහි යම් කොටසකට

සීමා විය යුතුය. ".

24. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 83 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 83 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) " අත්කර ගන්නා ලද " යන්නේ අර්ථ කථනයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

' " නියෝජිතයා " යන්න නිර්වාසික තැනැත්තකුට අදාළව යෙදෙන විට එයට —

(අ) ඒ තැනැත්තාගේ ශ්‍රී ලංකාවෙහි සිටින නියෝජිතයා, ඇටෝර්නි බලකරු, වෙළඳ නියෝජිතයා,' භාර ගන්නා හෝ කළමනාකරු ; සහ

(ආ) ශ්‍රී ලංකාවේ උපදින හෝ ශ්‍රී ලංකාවෙන් ලැබෙන යම් ලාභ හෝ ආදායමක් ඒ තැනැත්තා ලබන්නේ ශ්‍රී ලංකාවෙහි සිටින යම් තැනැත්තකු මාගීයෙන්ද ඒ තැනැත්තා

ඇතුළත් වේ ; ' ;

(2) "මුදල් බලකරු" යන්නේ අර්ථ කථනයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් අර්ථ කථන ඇතුළත් කිරීමෙන් :—

' "පවුල" යන්නෙන් 3 වන වගන්තියේ අර්ථානුකූල පවුලක් අදහස් වේ ;

"පීතකොමිස් භාරකරු" යන්නෙන් පීතකොමිස් කිරීමක් හේතු කොටගෙන යම් දේපළක අර්ථලාභී සම්බන්ධතාවක් ඇති තැනැත්තෙක් අදහස් වේ ; ' ;

(3) "ශුද්ධ ප්‍රාග්ධනය" යන්නේ අර්ථ කථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථ කථනය ආදේශ කිරීමෙන් ;

' "ශුද්ධ ප්‍රාග්ධනය" යන්න—

(අ) ශ්‍රී ලංකාවෙහි ප්‍රාග්ධනය තිබෙන නිර්වාසික සමාගමක් හැර වෙනත් යම් තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන කල්හි,—

(i) මුදලින් හෝ මුදලේ වටිනාකමින් ප්‍රතිෂ්ඨාවක් නොමැතිව හෝ සම්පූර්ණ ප්‍රතිෂ්ඨාවක් නොමැතිව ලබා ගන්නා ලද ණයක්,

(ii) සම්පූර්ණයෙන්ම තම ප්‍රයෝජනය සඳහා නොවූ ණයක්,

(iii) ආපසු මුදල් ලබා ගැන්මට නොහැකි නම් මිස, වෙන යම් තැනැත්තකුගෙන් මුදල් ආපසු ලබා ගැනීමේ අයිතිය පවත්නා ණයක්,

(iv) මෙම පනත යටතේ තම ප්‍රාග්ධනයෙන් අත් හැර ඇති තමාගේ යම් දේපළකින් ගෙවිය යුතු හෝ ඒ දේපළෙහි ඇපය පිට ලබා ගෙන ඇති හෝ ඒ දේපළ සම්බන්ධයෙන් දරා ඇති ණයක්,

(v) ණය ශ්‍රී ලංකාවෙහි දී ගෙවීමට ශිවිස ඇත්නම් හෝ ශ්‍රී ලංකාවේ දේපළකින් ගෙවිය යුතුව හෝ ඒ දේපළෙහි ඇපය පිට ලබාගෙන ඇත්නම් මිස ශ්‍රී ලංකාවෙන් පිටත දී තමා විසින් ලබා ගන්නා ලද යම් ණයක්,

යන මේ ණය හැර 1971 මාර්තු මස 31 වන දිනට ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු වූ ණයවල මුළු වටිනාකමට වඩා මේ පනතේ විධිවිධාන වලට අනුකූලව ගණන් බලන ලද ඒ තැනැත්තාගේ 1971 මාර්තු 31 වන දිනයේ ඇති ප්‍රාග්ධනයේ මුළු වටිනාකම යම් ප්‍රමාණයකින් වැඩි වන්නේ ද ඒ ප්‍රමාණය ඉන් අදහස් වන අතර දේපළෙහි විවිධ කොටස් වලින් අය විය යුතු එකම ණය එක් වරකට වඩා ගණන් නොගත යුතු ය, තවද

(ආ) ශ්‍රී ලංකාවෙහි ප්‍රාග්ධනය තිබෙන නිර්වාසික සමාගමක් සම්බන්ධයෙන් යෙදෙන කල්හි—

(i) මුදලින් හෝ මුදලේ වටිනාකමින් ප්‍රතිෂ්ඨාවක් නොමැතිව හෝ සම්පූර්ණ ප්‍රතිෂ්ඨාවක් නොමැතිව සමාගම විසින් ලබා ගන්නා ලද ණයක්,

(ii) සම්පූර්ණයෙන්ම සමාගමේ ප්‍රයෝජනය සඳහා නොවූ ණයයක්,

(iii) ආපසු මුදල් ලබා ගැන්මට නොහැකි නම් මිස වෙන යම් තැනැත්තකු ගෙන් මුදල් ආපසු ලබා ගැනීමේ අයිතිය පවත්නා ණයයක්,

(iv) මෙම පනත යටතේ සමාගමේ ප්‍රාග්ධනයෙන් අත්හැර ඇති සමාගමේ යම් දේපළකින් ගෙවිය යුතු හෝ ඒ දේපළෙහි ඇපය පිට ලබා ගෙන ඇති හෝ ඒ දේපළ සම්බන්ධ යෙන් දරා ඇති ණයයක්,

(v) ණය ශ්‍රී ලංකාවෙහි දී ගෙවීමට ගිවිස ඇත්නම් හෝ ශ්‍රී ලංකාවේ දේපළකින් ගෙවිය යුතුව හෝ ඒ දේපළෙහි ඇපය පිට ලබා ගෙන ඇත්නම් මිස ශ්‍රී ලංකාවෙන් පිටත දී සමාගම විසින් ලබා ගන්නා ලද ණයයක්

හැර 1971 මාර්තු 31 වන දිනයෙහි එහි ණය හා බැරකම් වශයෙන් තිබුනාවූත් ඒ එක් එක් ණය හෝ බැරකම් සමාගමේ ශ්‍රී ලංකාවෙහි ඇති ව්‍යාපාරය පවත්වා ගෙන යැමෙහිදී සමාගම විසින් ඇති කර ගන්නා ලද ණයයක් හෝ බැරකමක් වූත් සියලු ණය වල හා බැරකම් වල මුලු වටිනාකමට වඩා මේ පනතේ විධිවිධානවලට අනුකූලව ගණන් බලන ලද ඒ සමාගමේ ඒ දිනයේ ශ්‍රී ලංකාවේ ඇති ප්‍රාග්ධනයේ මුලු වටිනාකම යම් ප්‍රමාණයකින් වැඩි වන්නේ ද ඒ ප්‍රමාණය අදහස් වන අතර දේපළෙහි විවිධ කොටස් වලින් අය විය යුතු එකම ණය එක් වරකට වඩා ගණන් නොගත යුතු ය ;';

(4) "ප්‍රධාන පනත" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'"පෞද්ගලික සමාගම" යන්නට සමාගම් ආඥපනතෙහි ඒ යෙදුමට දී ඇති අර්ථය තිබිය යුතු ය :';

(5) "භාරකරු" යන්නේ අර්ථ කථනයෙහි අගට ඇති නැවතීමේ ලකුණ වෙනුවට තිත් කොමාවක් ආදේශ කිරීමෙන් ; හා

(6) ඒ වගන්තියේ අගට පහත සඳහන් අලුත් අර්ථ කථනය එකතු කිරීමෙන් :—

'"භාර්යාව" යන්නට නිසි බලය ඇති අධිකරණයක තීන්දු ප්‍රකාශයක් යටතේ හෝ යථා පරිදි ලියා අත්සන් කරන ලද වෙන්වීමේ ඔප්පුවක් යටතේ ස්වාමි පුරුෂයා ගෙන් වෙන් ව ජීවත්වන හෝ වෙන් ව ජීවත්වීම ස්ථිර වීමට ඉඩ ඇති තත්ත්වයන් යටතේ තමා ස්වාමි පුරුෂයාගෙන් ඇත්ත වශයෙන්ම වෙන් ව ජීවත් වන භාර්යාවක් ඇතුළත් නොවේ.'.

25. මෙම පනත ප්‍රධාන ප්‍රඥප්තිය ආරම්භ වූ දිනයෙහි ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය. අතීතයටත් බල පෑම.

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.